සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	6	ගණිතය	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

I කොටස

★ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**

★ **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.**

01. හය මිලියන දෙසිය හැට හත් දහස් හත්සිය තිස් දෙක සම්මත ආකාරයෙන් ලියන්න.

02. $2052 \div 19$ සුළු කරන්න.

03. දී ඇති රූපය තුළ ඇති මහා කෝණය a ලෙස ද පරාවර්ත කෝණය b ලෙස ද ලකුණු කර දක්වන්න.



04. -2 හා 4 අතර ඇති ධන නිඛිල ගණන කීයද ?

05.
$$\begin{array}{r} 1\ 5\ 7 \\ \times\quad 5\ \square \\ \hline 3\ 1\ 4 \\ 7\ \square\ 5\ 0 \\ \hline 8\ 1\ 6\ 4 \end{array}$$

හිස්තැන් සම්පූර්ණ කරන්න.

06. කොටුව දුම්රිය ස්ථානයෙන් පෙ.ව. 10.25ට පිටත්වන උඩරට මැණිකේ දුම්රිය ප.ව. 6.12 ට බදුල්ලට ළඟා විය. ගමනට ගතවූ කාලය කොපමණද ?

07. පහත සංඛ්‍යා රේඛාවෙන් දැක්වෙන්නේ සදිසිගේ හා අමායාගේ දැන් වයසය. ඔවුන් දෙදෙනා එකම දිනකදී උපන්දිනය සමරනු ලබයි.



සදිසිගේ උපන්දිනය 2019-03-03 නම් අමායාගේ උපන්දිනය කවදාද ?

08. $\frac{5}{12} + \frac{1}{4}$ සුළු කර පිළිතුර සරලම ආකාරයෙන් ලියා දක්වන්න.

Past Papers Wiki

09. වෙළෙන්දෙකු ළඟ තිබූ මුළු බිත්තර ගණන ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට 80 වේ. ඉන් බිත්තර දෙකක් බිඳී ඇති නිසා ඒවා ඉවත් කරනු ලැබේ. ඉතිරි බිත්තර ප්‍රමාණය ආසන්න 10 ගුණාකාරයට වැටයූ විට 70 ක් වේ. ඔහු ළඟ තිබූ මුළු බිත්තර ප්‍රමාණය සඳහා ගත හැකි අගයන් මොනවාද ?

10. $21.5 - 12.67$ සුළු කරන්න.

11. $7,23$ හි සාධකයක් වේද ? නොවේ ද ? යන්න හේතු සහිතව පැහැදිලි කරන්න.

12. $40 = 5 \times \square = 5 \times \square^{3}$ හිස් කොටුවලට සුදුසු අගයන් ලියන්න.

13. රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ,

i) පරිමිතිය සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න.

ii) $x = 10$ විට පරිමිතිය සොයන්න.



14. ත්‍රිකෝණ සංඛ්‍යාවක් ත්‍රිකෝණාකාර තිත් සටහනකින් නිරූපණය කළ විට යටම පේළියේ තිත් 6 ක් තිබිණි. ඒ කී වන ත්‍රිකෝණ සංඛ්‍යාව ද ? එය තිත් සටහනකින් ඇඳ දක්වන්න.

15. රූපයේ A හා B අක්ෂරවලින් දක්වා ඇති තල රූප නම් කරන්න.



16. $3 : 2$ ට තුල්‍ය අනුපාත දෙකක් ලියන්න.

17. පහත ප්‍රකාශ හරි නම් හරි ලකුණ ද (✓), වැරදි නම් වැරදි ලකුණ ද (✗) යොදන්න.

i)	සවිටි චතුස්තලයක දාර ගණන හා මුහුණත් ගණන සමානය.	
ii)	තලයක තිරස් බව මැනගැනීමට ස්ප්‍රීතු ලෙවලය භාවිතා කරයි.	

18. 67.53 හි 3 න් නිරූපිත අගය කීයද ?

19. $<$ හෝ $>$ අසමානතා ලකුණ යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

i) $\frac{48}{100}$ ..... 0.2 ii) $\frac{3}{4}$ 1

20. ගනුලි සංඛ්‍යාවක් සිතන ලදී. එම සංඛ්‍යාව 10 ට වඩා විශාල වන අතර 20 ට වඩා කුඩාය. 3 එම සංඛ්‍යාවේ සාධකයකි. ඇය සිතන ලද සංඛ්‍යාවේ ඇති ඉලක්කම් දෙකේ එකතුව 9 ක් නම් එම සංඛ්‍යාව සොයන්න.

II කොටස

★ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

★ **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, ඉතිරි ප්‍රශ්න වලට ලකුණු 11 බැගින් ද හිමිවේ.**

---

01. පාසලක ගණිතාගාරයේ බිත්ති සැරසිල්ලක කොටසක් පහත රූපයේ දැක්වේ. මෙය පාසලේ සිසුවෙකු විසින් 1 cm × 1 cm සමචතුරස්‍රාකාර කොටු වලින් නිර්මාණය කරන ලද්දකි.



i) බිත්ති සැරසිල්ල සඳහා භාවිත කළ කුඩා කොටුවක පරිමිතිය කොපමණද ? (ල. 01)

ii) අඳුරු කළ කොටසේ පරිමිතිය සොයන්න. (ල. 02)

iii) කුඩා කොටුවක වර්ගඵලය කොපමණද ? (ල. 01)

iv) අඳුරු කළ කොටසේ වර්ගඵලය සොයන්න. (ල. 02)

v) අඳුරු නොකළ කොටසේ වර්ගඵලය සහ මුළු රූපයේ වර්ගඵලය අතර අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න. (ල. 04)

vi) අඳුරු කළ කොටසේ වර්ගඵලය මුළු රූපයේ වර්ගඵලයෙන් භාගයක් ලෙස දක්වන්න. (ල. 02)

vii) ඉහත (vi) කොටසේ ලබාගත් පිළිතුර දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න. (ල. 02)

viii) ඉහත සැරසිල්ලේ පරිදි 1 cm × 1 cm කුඩා කොටු වලින් වර්ගඵලය 6 cm^2 වන තල රූපයක් ඇඳ දක්වන්න. (ල. 02)

ලකුණු 16

02. සෘජුකෝණාස්‍රය තුළ දක්වා ඇති සංඛ්‍යා ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

0.5	$\frac{3}{4}$	$\frac{1}{2}$	0.05
$\frac{1}{8}$	5.21		0.3

i) මෙහි ඇති සංඛ්‍යා සියල්ල කාණ්ඩ දෙකකට වෙන්කර ලියා තෝරාගත් පොදු ලක්ෂණය අනුව ඒවා නම් කරන්න. (ල. 02)

....

ii) භාග අතරින් විශාලම හා කුඩාම භාග ලියා එම භාග දෙකෙහි එකතුව සොයන්න. (ල. 03)

iii) අගය සොයන්න. $\frac{3}{4} - \frac{1}{2}$ (ල. 02)

iv) මෙහි ඇති දශම සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියා දක්වන්න. (ල. 02)

v) ඉහත විශාලම දශම සංඛ්‍යාව ගණක රාමුවෙහි දක්වන්න. (ල. 02)



ලකුණු 11

---

03. පාසල් පාදක ඇගයීමකදී ගණිත විෂයය සඳහා සිසුන් 38 දෙනෙකු ලබාගත් ලකුණු පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ. වගුව පරීක්ෂා කර හිස් කොටු සම්පූර්ණ කරන්න.

i)

ලකුණු	පළමු තීරයේ ඇති ලකුණු ලබා ගත් සිසුන්, ප්‍රගණන ලකුණු මගින්	සිසුන් සංඛ්‍යාව
8, 9, 10	𝍸 𝍸 //	.....
11, 12, 13	𝍸 /	.....
14, 15, 16	.....	7
17, 18, 19	.....	.....

(ල. 04)

ii) ඉහත වගුවේ තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක දක්වන්න.

(◯ සලකුණ මගින් සිසුන් 4 ක් නිරූපණය වන සේ)

8, 9, 10	
11, 12, 13	
14, 15, 16	
17, 18, 19	

(ල. 04)

iii) චිත්‍ර ප්‍රස්තාරය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න.

(a) ලකුණු 14 ට වඩා අඩුවෙන් ලකුණු ලබාගත් සිසුන් කී දෙනෙක් සිටීද ? (ල. 02)

(b) වැඩිම සිසුන් ගණනක් අයත් වන්නේ කවර ලකුණු කාණ්ඩයටද ? (ල. 01)

ලකුණු 11

---

04. 3 7 9 2 0 0 4 1 0 8 සංඛ්‍යාව,

i) සම්මත ආකාරයෙන් ලියා දක්වන්න. (ල. 01)

ii) ඉහත සම්මත ආකාරයෙන් ලියන ලද සංඛ්‍යාව පහත කොටු වලට ගැලපෙන අයුරින් යොදන්න. (ල. 02)



iii) ඉහත රූපසටහනේ දක්වා ඇති හිස්තැන් වලට අදාළ කලාප නාමයන් ලියන්න. (ල. 03)

iv) (i) හි ලියන ලද සංඛ්‍යාව වචනයෙන් ලියන්න. (ල. 02)

v) ඉහත සංඛ්‍යාවේ 4 න් නිරූපිත අගය 8 න් නිරූපිත අගය මෙන් කී ගුණයක්ද ? (ල. 03)

ලකුණු 11

---

05. i) පහත සුළු කිරීම්වලට අදාළව හිස්තැන් පුරවන්න. (ල. 05)

4 × 9 = [.....]

3 × 5 = [.....]

8 × 8 = [.....]

..... × ..... = [29]

..... × ..... = [81]

ඉහත **කොටු තුළ** ඇති සංඛ්‍යා ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

Past Papers Wiki

ii) හඳුනාගත හැකි සියලු සමචතුරස්‍ර සංඛ්‍යා හා ත්‍රිකෝණ සංඛ්‍යා වෙන වෙනම ලියා දක්වන්න. (ල. 02)

iii) ඉහත කොටු තුළ ඇති සියලු සංඛ්‍යා සුදුසු පරිදි තෝරා පහත වෘත්ත තුළ ලියා දක්වන්න.



ප්‍රථමක සංඛ්‍යා



සංයුත සංඛ්‍යා (ල. 02)

iv) සුළු කිරීමෙන් තොරව පහත ප්‍රකාශන සඳහා ලැබෙන පිළිතුරු ඔත්තේ ද නැතහොත් ඉරට්ට දැයි යන්න ලියා දක්වන්න.

(a) $4548 - 1542$ - .....

(b) 7541×9635 - .....

(ල. 02)

ලකුණු 11

---

06. (a) පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයට පැමිණෙන අමුත්තන්ට සංග්‍රහ කිරීම සඳහා පළතුරු බීම සෑදීමට නියමිතය. ඒ සඳහා පහත ආකාරයට අවශ්‍ය ද්‍රව්‍ය සපයාගනු ලැබේ.

★ ලීටර 2 බැගින් වූ පළතුරු යුෂ බෝතල් 2

★ ජලය ලීටර 10

★ මිලි ලීටර 100 දෙහි යුෂ බෝතල් 3

i) ඉහත සියලු ප්‍රමාණ භාවිතයෙන් සාදන ලද මුළු බීම ප්‍රමාණය ලීටර හා මිලිලීටර වලින් දක්වන්න. (ල. 03)

ii) ඉහත (i) හි බීම ප්‍රමාණය, මිලිලීටර වලින් දක්වන්න. (ල. 01)

iii) එක් අයෙකුට මිලිලීටර 190 බැගින් 75 දෙනෙකුට සංග්‍රහ කිරීමට කොපමණ බීම ප්‍රමාණයක් අවශ්‍ය වේද ? (ල. 02)

iv) එසේ සංග්‍රහ කිරීමෙන් පසු ඉතිරි බීම ප්‍රමාණය සොයන්න. (ල. 02)

(b) පහත හිස්තැන් පුරවන්න.

i) $1\,kg = 150\,g + 250\,g + 100\,g + \ldots\ldots\ldots g$

ii) $1\,kg = 8 \times \ldots\ldots\ldots g$

iii) $2\,kg = 250\,g \times \ldots\ldots\ldots$ (ල. 03)

ලකුණු 11

අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් සඳහා Past Papers Wiki වෙබ් අඩවිය පිවිසෙන්න

07. (a) පාසලේ වෙසක් සැරසිලි සඳහා ගෙනෙන ලද දඬු 3 ක් රූපයේ දැක්වේ.



i) M දණ්ඩේ දිග ප්‍රමාණය නොදන්නා බැවින් එහි දිග වීජීය සංකේතයකින් දක්වන්න. (ල. 01)

ii) දී ඇති රූපසටහන නිරීක්ෂණයෙන් දඬු තුනේ දිග ආරෝහණ පිළිවෙලට පෙළගස්වන්න. (ල. 01)

iii) L ට වඩා M දණ්ඩ කොපමණ දිගින් වැඩිද ? (ල. 02)

iv) M හා N දඬු දෙකෙහි දිග එකතුව කීයද ? (ල. 02)

v) M දණ්ඩේ දිග 20 m නම්, (iii) හා (iv) සඳහා ලැබුණු වීජීය ප්‍රකාශනවල අගය සොයන්න. (ල. 02)

(b)



සුපුන් P ස්ථානයෙන් ගමන් අරඹා ඔහුගේ නිවස වන Q වෙත ළඟා වේ.

i) ඔහු නිවස වෙත ළඟා වන විට උතුරු දිශාවට ගමන් කළ වාර ගණන කොපමණද ? (ල. 02)

ii) ඔහු A ස්ථානයේ සිටින විට B ස්ථානය පෙනෙන දිශාව කුමක්ද ? (ල. 01)

PAST PAPERS WIKI

ලකුණු 11

WWW.PastPapers.WiKi

* * *

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank